# ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික පාසලේ ක්‍රියාත්මක වන පන්ති කාමර කළමනාකරණය පිළිබඳ විමසීමක්.

## (කළුතර දිස්ත්‍රික්කය ඇසුරෙන්)

කොළඹ විශ්ව විද්‍යාලයේ

අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා

ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධනයයි.

UCLIB
498655

University of Colombo
Library
Sri Lanka

ජයස්‍රී ගජවීර

අධ්‍යාපනවේදී (විශේෂ) උපාධි,
(කොළඹ විශ්ව විද්‍යාලය)

අධ්‍යාපනපති පශ්චාත් උපාධි,
(කොළඹ විශ්ව විද්‍යාලය)

ඇතුළත් වීමේ අංකය: 95 / M. Phil/12

1999

# සංක්ෂිප්තය.

මෙම පර්යේෂණය "ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික පාසලේ ක්‍රියාත්මක වන පන්ති කාමර කළමනාකරණය" පිළිබඳව විමසා බැලෙන්නකි. ශ්‍රී ලංකාවේ පාසල් වල පන්ති කාමර ක්‍රියාවලිය අසතුටුදායක තත්වයක පවතින බව මෑත අතීතයේදී කිහිප අවස්ථාවනදීම අනාවරණය විය. විශේෂයෙන් තරුණ අසහනය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව (1989), හා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පළමුවන වාර්තාව (1992) මගින් පාසල් වලත්, පන්ති කාමර වලත්, ක්‍රියාකාරීත්වයේ අයහපත් තත්ත්වයන් පිළිබඳව තරුණු හෙළි දරව් විනි. එවැනි අසතුටුදායක තත්ත්වයන් පන්තිකාමර තුළ පවති නම් එය සමස්ත විධිමත් අධ්‍යාපන පද්ධතියටම ඉතාමත් හානිකර වේ. මෙම තත්ත්වය සැළකිල්ලට ගෙන විධිමත් අධ්‍යාපන ක්‍රියාවලියේ කුඩාම හා ප්‍රායෝගික ක්‍රියාකාරී ඒකකය වන පන්ති කාමරය පිළිබඳවත්, එහි කළමනාකාරීත්වය පිළිබඳවත්, විමසා බැලීම මෙම අධ්‍යයනයේ මුඛ්‍ය පරමාර්ථය විය.

මෙම පරමාර්ථය ඉටු කර ගැනීම සඳහා සුවිශේෂ අරමුණු 6 ක් ඔස්සේ අධ්‍යයනය දියත් කෙරිනි. එනම්:-

1. පාසලේ ගුණාත්මක වර්ධනය සඳහා පන්තිකාමර කළමනාකරණයක අවශ්‍යතාව විමසීම.
2. පන්ති කාමර ක්‍රියාවලිය තුළ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විමසීම.
3. පන්ති කාමර ක්‍රියාවලිය තුළ භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ විමසීම.
4. පන්ති කාමර කළමනාකරණයේදී ඇතිවන ගැටලු හා බාධක පිළිබඳව සොයා බැලීම.

(අ.පි.බ.)

University of Colombo Library Sri Lanka

5. ඉහත හමුවන ගැටලු වලට යෙදිය හැකි පිළියම් පිළිබඳව යෝජනා හා අදහස් ලබා ගැනීම.
6. සාර්ථක පන්ති කාමර කළමනාකරණයකට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම යනුයි.

මෙම අරමුණු පිළිබඳවත්, අධ්‍යයනයෙහි පසුබිම, එහි ස්වභාවය හා වැදගත්කම පිළි බඳවත්, මෙහි පළමු පරිච්ඡේදයේ විස්තර කර තිබේ. තවමත් අපගේ පාසල් පද්ධතිය තුළ විධිමත් ලෙස පන්ති කාමර පාදක කළමනාකරණ ක්‍රියාවලියක් සිදු නොවන අතර, පාසල් යන්ත්‍රනය සඳහා පමණක් නොව, සිසුන්ගේ අනාගත හැඩගැස්ම සඳහා ද පන්ති කළමනාකරණ ක්‍රියාවලියක අවශ්‍යතාවත්, වැදගත්කමත් මෙහිදී පෙන්වා දී තිබේ.

" පන්ති කළමනාකරණ ක්‍රියාවලිය" පිළිබඳ සාහිත්‍ය විමර්ශනය දෙවන පරිච්ඡේදයෙන් ඉදිරිපත් කර ඇත. මෙහිදී පන්ති කාමර ක්‍රියාවලිය පිළිබඳ විදේශීය පර්යේෂණ හා අධ්‍යයන තොරතුරුත්, ශ්‍රී ලංකාවේ පන්තිකාමර ක්‍රියාවලිය පිළිබඳ කළ විමසීම් ද, කාල ක්‍රමානුගතව ඉදිරිපත් කර ඇත. විධිමත් අධ්‍යාපන ක්‍රමයේ ගුණාත්මක වර්ධනයක් සඳහා පන්ති කළමනාකරණ ක්‍රියාවලියක අවශ්‍යතාව ද සාහිත්‍ය විමසීම ඇසුරෙන් පෙන්වා දී තිබේ.

මෙහි තෙවන පරිච්ඡේදයෙන් " පන්ති කළමනාකරණ " සංකල්පය විමසීමට භාජනය කර තිබේ. මෙහිදී මූලික වශයෙන් " කළමනාකරණ " සංකල්පය පිළිබඳවත්, දෙවනුව අධ්‍යාපන කළමනාකරණය හා එහි ස්වභාවය පිළිබඳවත්, අනතුරුව පන්ති කළමනාකරණය පිළිබඳවත්, කරුණු දක්වා තිබේ. කළමනාකරණ සංකල්පය යටතේ ඒ පිළිබඳ

(අ.පි.බ.)

අර්ථ දැක්වීම් ද, කළමනාකරණ චින්තනය විකාශනය වූ අයුරු ද දක්වා තිබේ. අධ්‍යාපන කළමනාකරණය හා එහි ස්වභාවය යටතේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ කළමනාකරණයෙහි සුවිශේෂතාවන් හා පැන නැඟී ඇති ගැටලු තත්වයන්ද, විමසීමට භාජනය කර තිබේ. පන්ති කළමනාකරණය යටතේ ඒ පිළිබඳ අර්ථ දැක්වීම් ද, ඉදිරිපත් කරමින් මූලික කළමනාකරණ සංකල්ප ඔස්සේ පන්ති කාමර ක්‍රියාවලිය විමසා තිබේ.

මෙහි සිව්වන පරිච්ඡේදයේ දී පර්යේෂණයේ ක්‍රමවේදය විස්තර කෙරේ. මෙම අධ්‍යයනය විස්තරාත්මක පර්යේෂණ ගණයට අයත් වූ නියැදි පිළිබඳ සමීක්ෂණ පර්යේෂණයකි. සමාජ විද්‍යා හා අධ්‍යාපනික පර්යේෂණ සිදු කිරීමේදී යොදාගෙන ඇති ප්‍රමාණාත්මක පර්යේෂණ ( quantitative ) හා ගුණාත්මක පර්යේෂණ ( qualitative) ක්‍රම පිළිබඳවද කරුණු දක්වා ඇති අතර අද්‍යතන අධ්‍යයනය එම ක්‍රම දෙකේ සම්මිශ්‍රණයක් බව දක්වා තිබේ. කළුතර දිස්ත්‍රික්කයේ ස්ථරගත අහඹු නියැදියකින් තෝරා ගත් පාසල් 15 ක් ඇසුරින්, ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ යන මිනුම් උපකරණ යොදා ගනිමින්, අධ්‍යයනය සිදු කෙරිණි. දත්ත විශ්ලේෂණය ප්‍රතිශත ඇසුරින් හා විස්තරාත්මකව සිදු කෙරිණි.

පස් වන පරිච්ඡේදය දත්ත ඉදිරිපත් කිරීම හා විශ්ලේෂණය සඳහා වෙන් කෙරිණි. මෙහිදී පළමුවෙන්ම ප්‍රශ්නාවලි මඟින් ලබා ගත් තොරතුරුත්, අනතුරුව සම්මුඛ සාකච්ඡා පළමුවන පියවර මඟින් ලබා ගත් තොරතුරුත්, ඉන් පසු පන්ති කාමර නිරීක්ෂණය මඟින් ලබා ගත් තොරතුරුත්, අවසාන වශයෙන් සම්මුඛ සාකච්ඡා දෙවන පියවර මඟින් ලබා ගත් තොරතුරුත්, ඉදිරිපත් කර ඇත. දත්ත ඉදිරිපත් කිරීමේදී-

(අ.පි.බ.)

_ ඒ ඒ පාසල් වර්ග අනුව අනුකාණ්ඩ ගත කොට දක්වා ඇති අතර, ප්‍රතිශත හා විස්තරාත්මකව දත්ත විශ්ලේෂණය කර ඇත.

මෙහි 6 වන පරිච්ඡේදයේදී නිගමන හා යෝජනා යටතේ, මානව සම්පත් හා භෞතික සම්පත් පිළිබඳව පන්ති කාමර වල පවතින තත්ත්වයන්, ගුරු සිසු චර්යාවන් පිළිබඳවත්, පන්ති කළමනාකරණයේදී උද්ගත වී තිබුණු බාධක හා ගැටලු පිළිබඳවත් පර්යේෂණ අනාවරණයන්, වෙනත් අධ්‍යයන හා සන්සන්දනාත්මකව ඉදිරිපත් කර ඇත. අවසාන වශයෙන් සාර්ථක පන්ති කාමර කළමනාකරණයකට අවශ්‍ය යෝජනාද මේ පිළිබඳව වැඩි දුර පර්යේෂණ සඳහා ඉඟි ද ඉදිරිපත් කරමින් පර්යේෂණය අවසන් කර තිබේ.